ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2023
පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය 2023

I - පත්‍රය

විභාග අංකය :.....

පැය 01

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන **කොටුව තුළ ඇති තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න 40 ක්** ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම **පිළිතුරු තුන බැගින්** දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයකට අදාළ **නිවැරදි පිළිතුර** තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**
- **කටුවැඩ සඳහා කඩදාසියක් සපයනු** ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	


	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ඇති ලකුණු නිවැරදි බව සහතික කරමි.	V/II/SM
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/II/S/CH

- අංක 01 හා 02 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.


01.



02.




03. පහත දී ඇති රූප තුනෙන් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම රූපය තෝරන්න.




- 4 හා 5 ප්‍රශ්නවල රටාව අනුව හිස් තැනට ගැළපෙන නිවැරදි රූපය තෝරන්න.

04.



05.



06. පෙර ලක් විරුවන් - කළ තම යුතුකම්
සිහියට නගමින් - ලක් මව සුරකින්

මෙම කවියේ අදහස නිරූපණය කරන සුදුසු ම පිළිතුර වන්නේ,

(i) අතීතයේ සිටි ලක් විරුවන් කළ මෙහෙය පිළිබඳව ය.

(ii) අතීතයේ සිටි ලක් විරුවන් නිතර සිහි කිරීමේ අගය පිළිබඳව ය.

(iii) පෙර ලක් විරුවන් මෙන් ලක් මව සුරකීමට දායක වීම පිළිබඳව ය.


07. යම් අවස්ථාවක සිදු වූ සංවාදයක අනුපිළිවෙළ වෙනස් කර පහත දක්වා ඇත. එම සංවාදයේ නිවැරදි අනුපිළිවෙල ඉංග්‍රීසි අක්ෂර මඟින් නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. අම්මාට අසනීපයි.
B. බස් එකේ ආවේ.
C. අම්මා ආවේ නැත්තේ ඇයි?
D. එන්න, ඇතුළෙන් වාඩි වෙන්න.
E. සුබ උදැසනක්! දීපිකා කොහොම ද ආවේ ?

(i) EBCDA (ii) EBCAD (iii) EDCAB

08. මෙම පින්තූර දෙකෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පාසලක 4 ශ්‍රේණියේ දරුවෙක් විසින් චිත්‍රයට නඟන ලද බස් රථ දෙකකි. එම චිත්‍ර දෙක අතරින්

(i) A පමණක් නිවැරදි ය.
(ii) B පමණක් නිවැරදි ය.
(iii) A හා B දෙකම නිවැරදි ය.



09. පහත දැක්වෙන සංඛ්‍යා සහිත කොටු ජාලය පරීක්ෂා කර බලා A අකුරින් දැක්වෙන කොටසට ගැළපෙන පිළිතුර තෝරන්න. මෙහි සිරස් හා තිරස් පැතිවල එක් ඉලක්කමක් එක්වරක් පමණක් යෙදී ඇත.

3	4	8		A	
8	3	7	2		4
2	7	3	5	4	8
7	2	5	4	8	3
5	8	4	3	7	2
4	5	2	8	3	7

	7 2 5	
	4	
(1)		

	3 5 4	
	8	
(2)		

	7 2 5	
	5	
(3)		

10. පහත සඳහන් ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.


(i) ශ්‍රී ලංකාව දූපතකි. එය මැලේසියාවට බටහිර දිශාවෙන් පිහිටා ඇත.

(ii) බණ්ඩක්කා කරල් විශේෂයකි. එය එතරම් දිගට නොවැඩෙන වැලක හට ගන්නා එළවළුවකි.

(iii) කතරගම උඩරට පළාතට අයත් වූ මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි පුද බිමකි.

- අංක 11 හා 12 ප්‍රශ්නවල දැක්වෙන සංඛ්‍යා රටා සම්පූර්ණ කිරීමට සුදුසු පිළිතුර තෝරන්න.

11.




(i) 30


(ii) 20

(ii) 42


12.



(i) 24




(ii) 17



(iii) 42

13. පහත දැක්වෙන්නේ ඝනකයක් දිගහැරි විට ලැබුණු පතරොමකි. එහි මුහුණත් A,B,C,D,E,F යන ඉංග්‍රීසි අක්ෂර වලින් පෙන්වා ඇත. ඒ අනුව එහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත් වෙන් වෙන් ව දක්වා ඇති නිවැරදි පිළිතුර තෝරන්න.



(i) A C , B D , E F (ii) A D , B F , E C (iii) B E , CF , A D

14. △ △ △ = ☆☆☆☆ හා ◯◯ = △ △ △ △ වේ. මෙම පැහැදිලි කිරීමට අනුව වඩාත් නිවැරදි සම්බන්ධතාවය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(i) △ △ △ △ △ = ☆☆☆☆◯◯

(ii) ◯◯△◯ = ☆☆☆☆△△

(iii) △ △ △☆◯ = ☆☆☆☆☆△△

15. අයියා සහ මල්ලි ළඟ ඇති මුදලේ එකතුව රු.140.00 කි. අයියා මල්ලීට රු.20.00ක් දුන් විට දෙදෙනා ළඟ ඇති මුදල සමාන වෙයි. දෙදෙනා ළඟ ඇති මුදල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) රු. 100.00 හා රු. 40.00


(ii) රු. 90.00 හා රු. 50.00

(iii) රු. 80.00 හා රු. 60.00

16. 2024 වර්ෂයේ පළමු පාසල් වාරය ජනවාරි 02 දායින් ආරම්භ වී අප්‍රේල් 08 දායින් අවසන් වෙයි. ඒ අනුව ජනවාරි 02 සිට අප්‍රේල් 08 තෙක් කැලැන්ඩරයේ සටහන්ව ඇති මුළු දින ගණන කීයද?

(i) දින 99 (ii) දින 98 (iii) දින 100

17. පහත රූප සටහනෙන් පෙන්වා ඇත්තේ කුඩා ගණක එකතුකර සෑදූ විශාල ඝනකයක ඉදිරි පෙනුමයි. ඉදිරි පෙනුමේ පැති පාට කර ඇති ආකාරයට ම සියලුම පැතිවල කුඩා ඝනකවල මුහුණත් පාට කර ඇත. ඒ අනුව මුළු ඝනකයේම පාට කර නොමැති කුඩා ඝනක කැට ගණන කීයද?



(i) 13 (ii) 14 (iii) 24

18. වෛද්‍යවරයකු විසින් අසාධ්‍ය රෝගියකුට දීමට නිර්දේශ කළ බෙහෙත් වට්ටෝරුවක් හා උපදෙස් පහත දැක්වෙයි. ඒ ඇසුරෙන් ගැටලුව විසඳා පිළිතුර තෝරන්න.

සුදු පාට පෙති	- පැය 3 කට වරක් 1 බොන්න
රෝස පාට පෙති	- පැය 1 කට වරක් 1 බොන්න
කහපාට පෙති	- පැය 2 කට වරක් 1 බොන්න

උදෑසන 5 ට මේ වර්ග 3 ම එකවර බිව්වේ නම් යලිත් බෙහෙත් පෙති වර්ග තුන ම එකවර බොන වේලාව වන්නේ,

(i) පෙ.ව 11. 00 (ii) පෙ.ව 10. 00 (iii) පෙ.ව 9. 00

19. A ගේ පියා B ගේ පුතානම් A යනු B ගේ කවුරුන් විය හැකිද ?

(i) මල්ලී හෝ නංගී ය (ii) මුනුබුරා හෝ මිනිබිරිය ය (iii) පුතා හෝ දුව

20. ක්‍රිකට් තරගයක දී පිතිකරුවන් 5 දෙනෙක් ලබාගත් ලකුණුවල එකතුව ලකුණු 325කි. පිතිකරුවන් තුන් දෙනෙක් පිළිවෙළින් ලකුණු 120, 22 හා 53 ක් ලබා ගන්නා ලදි. ඉතිරි පිතිකරුවන් ලබාගත් ලකුණු සමාන නම් එක් පිතිකරුවෙක් ලබාගත් ලකුණු ගණන වන්නේ,

(i) 130 (ii) 195 (iii) 65

21. කමල්ට කවියක් පාඩම් කිරීමට මිනිත්තු 25 ක් ද නිමල්ට මිනිත්තු 10 ක් ද ගතවෙයි. ඔවුන් දෙදෙනා ම කවි පාඩම් කිරීම පෙරවරු 8.00ට ආරම්භ කළේ නම් දෙදෙනාට ම කවි 14 ක් පාඩම් කිරීමට ගත වූ කාලය කොපමණ ද?

(i) මිනිත්තු 100 (ii) මිනිත්තු 200 (iii) මිනිත්තු 120

22. සෑම පැය 3 කට ම වරක් දෙගුණයක් වී වැඩෙන පාසි වර්ගයක් නිසා වැවක් පැය 18 කින් සම්පූර්ණයෙන් ම වැසී ගියේ ය. ඒ අනුව මෙම ජලාශයෙන් $^1/_4$ ක් වැසී යාමට කොපමණ කාලයක් ගතවන්නට ඇති ද?

(i) පැය 6 (ii) පැය 18 (iii) පැය 12


23. එක ම පංතියේ ඉගෙනුම ලැබූ වෛද්‍යරත්න, ගුරුසිංහ, ලියන ආරච්චි යන තිදෙනා පදිංචි වී සිටින්නේ පළාත් 3ක ය. ඔවුන් අතරෙන් එක් අයෙක් වෛද්‍යවරයෙකි. ඔහු ගාල්ලේ පදිංචි නැත. ගුරුසිංහ ගුරුවරයෙක් වන අතර ඔහු මහනුවර පදිංචි නැත. ඉංජිනේරුවෙක් වූ ලියන ආරච්චි බස්නාහිර පළාතේ පදිංචි අයෙකි. මේ අතුරින් වෛද්‍යවරයා පදිංචි වී සිටින පළාත විය හැක්කේ,

(i) දකුණු පළාත (ii) මධ්‍යම පළාත (iii) බස්නාහිර පළාත

24. එකිනෙකට ගැටගසා නැති වර්ගයෙන්, හැඩයෙන්, ප්‍රමාණයෙන් සමාන කළු, සුදු, නිල්, රතු, කොළ වර්ණ වලින් සපත්තු යුගල් 5ක් බැගින් පෙට්ටියකට දමා ඇත. පුද්ගලයෙකුගේ දෑස් බැඳ පෙට්ටියෙන් සපත්තු ඉවතට ගන්නේ නම් කළු සපත්තු යුගලයක් ස්ථිරව ම ඉවතට ගැනීමට ඉවතට ගත යුතු සපත්තු ගණන කීය ද?

(i) 32 (ii) 36 (iii) 46

25. ටැංකියක් පිරවීමට A නළයට පමණක් මිනිත්තු 6 ක් ද, B නළයට පමණක් මිනිත්තු 3 ක් ද ගත වෙයි. C නළයට සම්පූර්ණයෙන්ම ටැංකිය හිස් කිරීමට මිනිත්තු 4 ක් ගතවෙයි. ටැංකිය හිස් ව තිබෙන අවස්ථාවක මෙම නළ තුන ම එකවර විවෘත්ත කළ හොත් ටැංකිය සම්පූර්ණයෙන් ම පිරී යාමට ගත වන කාලය කොපමණ ද?




(i) මි. 5 (ii) මි. 4 (iii) මි. 3

26. බල්බ වැලක බල්බ 239 ක් තිබෙන අතර එම බල්බ නිල්, කහ, සුදු, රෝස යන පිළිවෙළට සවි කර ඇත. එම වැලේ හරි මැද බල්බයට බල්බ දෙකකට පෙර බල්බයේ වර්ණය විය හැක්කේ කුමක් ද?

(i) රෝස (ii) නිල් (iii) සුදු

27. පහත දැක්වෙන්නේ සමපාද ත්‍රිකෝණයකි. මෙම ත්‍රිකෝණය තුළ ත්‍රිකෝණ 28 ක් නිරූපණය කිරීම සඳහා A නමැති මුල්ලේ සිට B C පාදය දක්වා රේඛා අඳින ලදි. ඔහු අඳින ලද රේඛා ගණන කීය ද?




(i) 27 (ii) 6 (iii) 12

28. එක්තරා නගර කිහිපයක් අතර දුර පිළිබඳ සටහනක් පහත දැක්වේ.

A හා B නගර අතර දුර 12Km කි. A හා B අතර පිහිටි C නගරය A නගරයේ සිට 3km ක් දුරින් පිහිටා ඇත. ඒ අනුව C හා B අතර දුර A හා B අතර දුරෙන් කීයෙන් පංගුවක්ද?

(i) $^1/_3$ (ii) $^2/_3$ (iii) $^3/_4$

29. අඳුරු කළ කොටස මෙන් මුළු රූපය කී ගුණයක් ද?



(i) 9 (ii) 10 (iii) 5

- ABCDE යන ළමයි පස් දෙනෙක් පෝළිමක සිටගෙන සිටිති. එම පස් දෙනාට හිමි ස්ථාන දක්වා ඇත්තේ අනුපිළිවෙළට නොවේ. ඒවා ගළපා තේරුම් ගෙන 30, 31 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ළමයි	A	B	C	D	E
ස්ථාන	1	2	3	4	5

B	C	D
1	2	3

C	A	E
2	5	4

D	C	A
2	5	3

30. මේ අනුව පේළියේ සිටින අවසාන කෙනා කවු ද ?

(i) E (ii) A (iii) C

31. පේළියේ හරිමැද සිටින කෙනා පහත අය අතරින් කවුරුන් ද?

(i) D (ii) C (iii) E

- හදිසි නඩත්තු කටයුත්තක් හේතුවෙන් ජල සම්පාදන මණ්ඩලය විසින් අද දින ජල සැපයුම විසන්ධි කරන කාල වේලාවන් දක්වා ඇති දැන්වීමක් පහත දැක්වෙයි. ඒ ඇසුරෙන් 3 හා 32 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ප්‍රදේශය	විසන්ධි කරන වේලාව	විසන්ධි කර පවත්නා කාලය
4 වන හරස් වීදිය	පෙ.ව. 6.45	පැය 4. මි. 30
5 වන හරස් වීදිය	පෙ.ව. 8.30	පැය. 3 මි. 00
6 වන හරස් වීදිය	පෙ.ව. 11.15	පැය 2 මි. 30

32. මේ අනුව පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) දහවල් 12.00 වීමට මත්තෙන් ජලය ලැබෙන ප්‍රදේශ දෙකක් ඇත.


(ii) 4 වන හරස් වීදියට ජලය ලැබෙන්නේ 5 වන හරස් වීදියට ජලය ලැබීමෙන් පසුවය.

(iii) 6 වන හරස් වීදියට ජලය ලැබෙන්නට පෙර 5 වන හරස් වීදියට ජලය ලැබේ.

33. 4 වන හරස් වීදියට නැවත ජල සැපයුම සිදුවන්නේ කීයට ද?

(i) පැය 11:30 ට පසු (ii) පැය 04:30 ට පසු (iii) පැය 11:15 ට පසු

34. පහත දැක්වෙන්නේ එකිනෙකට සම්බන්ධ කර ඇති දැති රෝද කට්ටලයකි. මෙහි B දැති රෝදය ඊ තලයෙන් පෙන්වා ඇති ආකාරයට වාමාවර්ත ව (වම් පැත්තට) කරකැවෙයි. ඒ අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(i) වැඩිම වේගයෙන් A දැති රෝදය ද අඩු ම වේගයකින් D දැති රෝදය ද කරකැවෙයි.

(ii) B දැති රෝදය D දැති රෝදය කරකැවෙන දිශාවට ම කරකැවෙයි.


(iii) B , A හා D දැතිරෝද එක ම දිශාවට කරකැවෙයි.

35. එක්තරා ක්‍රීඩා උත්සවයක සරඹ සන්දර්ශනයක ළමුන් සිටගෙන සිටියේ පහත රූප සටහනේ පෙනෙන පරිදිය. එහි A B C D යන ඕනෑම ස්ථානයක සිට බැලූ විට ළමුන් 25 දෙනෙක් පෙනෙයි. සරඹ සන්දර්ශනයට සහභාගී වූ මුළු ළමයි ගණන කීය ද?



(i) 125 (ii) 121 (iii) 97

- පහත රූප සටහන ඇසුරෙන් 35 හා 36 ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරන්න.



36. මුවා නියෝජනය කරන අක්ෂරය කුමක් ද?

(i) F (ii) D (iii) E

37. කොටියා හා පූසා නියෝජනය කරන අක්ෂර පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(i) G F (ii) F A (iii) C B

38. අජිත්, කමල් හා විමල් යන තිදෙනා ගමනක් යාමට පිටත් වූ වේලාවන් පහත දැක්වෙයි. මේ පුද්ගලයන් ගමනේ නියමිත ස්ථානයට එකම වේලාවට පැමිණියේ නම් ඔවුන්ගේ වේගය අනුව වැඩි බවේ සිට අඩු බව දක්වා පෙළ ගස්වා ඇති පිළිතුර තෝරන්න.


අජිත්


කමල්



විමල්

(i) අජිත්, කමල්, විමල් (ii) කමල්, අජිත්, විමල් (iii) විමල්, අජිත්, කමල්

39. බිම් මහළේ සිට 6 වන මහළ තෙක් ඇති සෑම පඩිපෙළකම සමාන පඩි සංඛ්‍යාව බැගින් තිබේ. එම පඩි පේළියක් නැග අවසන් කිරීමට නිමල්ට මිනිත්තු 3 ක් ගත වෙයි. එසේ නම් බිම් මහළේ සිට 6 වන මහළ තෙක් නගින නිමල්ට පඩිපේළි සියල්ල නැග අවසන් කිරීමට ගතවන කාලය කොපමණ ද?

(i) මි. 18 (ii) මි. 15 (iii) මි.12

40. මෙම රූපයේ ඉලක්කම් සහිත රාමුව ස්ථාවරම පවතී. පිටත රවුම දකුණු අතට කරකැවෙයි. ඒ අනුව A අක්ෂරය 7 ඉලක්කමට යොමුවන විට E අක්ෂරය ඉදිරියේ පිහිටන අක්ෂරය කුමක් ද?



(i) 3 (ii) 5 (iii) 2

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES 2023

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය 2023

II පත්‍රය

කාලය : පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය :-.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/E/MF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/I/S/CH

01. පහත දැක්වෙන ඡේදය කියවන්න.

මුවින් පිටවන ශබ්ද ලියා දැක්වීම සඳහා භාවිත කරන සංකේත අක්ෂර ලෙස හැඳින්වෙයි. වර්තමානයේ ලිවීම සඳහා සම්මත කරගෙන ඇති සිංහල අක්ෂර මාලාව හෙවත් සිංහල හෝඩිය අකුරු හැටකින් සමන්විත වෙයි. එම අකුරු හැට ස්වර සහ ව්‍යඤ්ජන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වයි. ස්වර අක්ෂර ගණන හා ව්‍යඤ්ජන අක්ෂර ගණන පිළිවෙළින් දහඅටක් සහ හතළිස් දෙකක් වෙයි. ස්වර අක්ෂර නියෝජනය කිරීමට පිල්ලම් යොදන අතර 'අ' ස්වරය නියෝජනය කිරීමට පිල්ලමක් නොයෙදෙයි.

පහත ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

(1) සිංහල අක්ෂර මාලාව හඳුන්වන තවත් නමක් ඡේදයෙන් තෝරා ලියන්න. .....

.....

(2) අක්ෂර ලෙස හැඳින්වෙන්නේ මොනවා ද ? .....

.....

(3) සිංහල අක්ෂර මාලාවේ මුළු ව්‍යඤ්ජන අක්ෂර ගණන කීය ද ? .....

(4) සිංහල අක්ෂර මාලාවේ අක්ෂර හැට බෙදෙන ප්‍රධාන කොටස් දෙක කුමක් ද ?.....

.....

(5) පිල්ලමක් නොයෙදෙන ස්වර ශබ්දය කුමක් ද? .....

(6) පිල්ලම් මගින් නියෝජනය කරන්නේ මොනවා ද?.....

02. පහත සඳහන් වැකියේ වචනවල ඇති වැරදි අක්ෂර නිවැරදි කරමින් වාක්‍යය නැවත ලියන්න.

අප පාසලේ වාර්ෂික ව පවත්වන ත්‍යාග ප්‍රදානෝත්සවය අධ්‍යාපන ලේඛම්තුමාගේ ප්‍රදානත්වයෙන් පැවැත්වුණි.

.....

.....

03. පහත සඳහන් වගන්ති අතීත කාල ක්‍රියා පද යොදමින් ලිඛිත බසට හරවා නැවත ලියන්න.

(i) ගස් සුළඟට සෙලවෙනවා.

.....

(ii) වෛද්‍යවරිය රෝහලට ඇවිත් රෝගීන් පරීක්ෂා කරනවා.

.....

04. පහත වැකියට ගැළපෙන විරාම ලකුණු යොදන්න.

ලොකු අම්මා තාත්තාගේ ලොකු අයියාගේ බිරිඳ ඇගේ මේ අහිංසක සිහිනවල සිටි අපූරුතම වීරවරිය යි

05. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

කණ්ඩායම / සමීපයට / පැමිණියේ ය. / කෙළවර /ගැල් / වනාන්තරයේ

.....

06. ''අදූරදර්ශී ලෙස ලබා දෙන උපදෙසක්'' යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

.....

07. පහත එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(1) පවනි සහ ගයනි පිරිසිදු ජලය පානය කළා ය. (.....)

(2) උෆ සිංහ ධේනුව සහ පැටියා සිටින අයුරු දුටුවේ ය. (.....)

(3) ගුරුතුමිය ළමයින් සංඛ්‍යාව ගණන් කළා ය. (.....)

(4) මම ගුරුවරයෙක් වී රටට වැඩදායක සේවයක් කරමි. (.....)

08. ''පුවත'' යන වචනයට සමානාර්ථ පදයක් ලියන්න. .....

09. පහත දැක්වෙන යුගල පද අතරින් වඩාත් ගැළපෙන යුගල පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න. (වතු පිටි , යාන වාහන , කෙළි සෙල්ලම් , පොත් පත්)

(1) නගරය තුළ පාරේ ..... තදබදය දැඩි ලෙස පැවතුණි.

(2) ශිෂ්‍යයාගේ මේසය පුරා ..... අපිළිවෙළට තිබුණි.


10. තමාට පැවරුණු වගකීමකින් බේරීමේ දී ප්‍රකාශ කිරීමට සුදුසු ඉඟිවැකිය කුමක් ද?

.....

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

(1) plate :- ..... (2) hoppers :- .....

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(1) 

M					i		

(2) 

T				h					

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) in / canteen. / are / the / They .....

(ii) a / This / tree / is / banana .....

14. 'වේණ්ඩාම්' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න. .....

15. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

පේළියට හිටගන්න. .....

16. 'තිස්දහස් තුන්සිය තිහ' සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. :-.....

17. සියයස්ථානය 9, එකස්ථානය 6, දහසස්ථානයේ 9 සහ දහයස්ථානය 0 වන ලෙස ඉලක්කම් පිහිටන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න. :-.....

18. පහත සංඛ්‍යා රටාවේ පොදු අන්තරය ලියන්න.

47 , 54 , 61 , 68 , 75 , :-.....

19. පහත A , B , C කොටුවල ඇති ඉලක්කම් නිරීක්ෂණය කර විශාල ම සංඛ්‍යාව සෑදිය හැකි ඉලක්කම් ඇතුළත් කොටුව අයත් ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.

A	**B**	**C**
8 6 7	0 2 9	7 5 6

:-.....

20. පහත කොටුවේ ඇති සංඛ්‍යා භාවිතයෙන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

2206	2224
1027	
3227	1418

(1) එකතුව ලෙස 3624 ලැබෙන සංඛ්‍යා දෙක ලියන්න.

....

(2) වෙනස ලෙස 1003 ලැබෙන සංඛ්‍යා දෙක ලියන්න.


....

21. එක් කොමඩු ගෙඩියක් 4 දෙනෙකුට බෙදා දීමට ප්‍රමාණවත් වේ නම් එවැනි කොමඩු ගෙඩි 79ක් කී දෙනෙකුට ප්‍රමාණවත් වේ ද? :-.....

22. A ඇළ මාර්ගයේ දිග 103 km කි. B ඇළ මාර්ගයේ දිග 77 km 350 m කි. A ඇළ මාර්ගයට වඩා B ඇළ මාර්ගය කොපමණ දිගින් අඩු ද? :-.....

23. පුටු 540ක් කාමර පහක සමාන ප්‍රමාණවලින් තබා ඇත. එක් කාමරයක තබා ඇති පුටු ගණන කීය ද? :-.....

24.



මෙම සමචතුරස්‍රයයේ 1/4 (කාලක්) පාට කරන්න.


25. ප්‍රසාද් එකක් රු.37.50ක් වටිනා පොත් දෙකක් මිලට ගෙන වෙළෙන්දාට රු.100 ක මුදල් නෝට්ටුවක් දුන්විට ඉතුරු ලෙස ලැබෙන මුදල කීය ද ? :-.....

26. පහත දැක්වෙන ලීටර හා මිලිලීටර ප්‍රමාණ එකතු කරන්න.

	l				ml	
	4	**6**			**9**	**5**
+	**2**	**7**			**8**	**5**


27. කවිඳු 8kg 50 g ක් බර වට්ටක්කා ගෙඩියක් කැබලි තුනකට කැපුවේ ය. ඉන් කැබලි දෙකක බර 290 gක් හා 370 gක් වේ. ඉතුරු කැබැල්ලේ බර කොපමණ ද? :-.....

28.



වේලාව **තුන පසු වී මිනිත්තු පනහ** ඔරලෝසු මුහුණතේ ඇඳ දක්වන්න.

29. එක්තරා වෙළඳසැලක සතියේ දින පහක දී විකුණූ දොඩම් ගෙඩි ගණන 40කි. ඒ පිළිබඳ විස්තරය පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.



(1) දී ඇති තොරතුරු ඇසුරින් බදාදා විකුණූ දොඩම් ගෙඩි ගණන ප්‍රස්තාරයේ නිරූපණය කරන්න.

(2) සමාන ප්‍රමාණයෙන් දොඩම් විකුණූ දින ගණන කීය ද?.....

.....

- **30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතරින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

30. යමක් ජයග්‍රහණය කිරීමට නම් ඔබ තුළ තිබිය යුතු වැදගත් ලක්ෂණයකි.

(1) කලබලයෙන් ඉක්මනින් වැඩ කිරීම.

(2) කම්මැළිකමින් යුක්ත වීම.

(3) නියමිත කාලයට වැඩ කිරීම.

31. සැම විට ම අප තුළ ඇති කර ගත යුතු යහපත් චර්යාවකි.

(1) බයාදු චර්යා (2) සහනශීලි චර්යා (3) ආක්‍රමණශීලි චර්යා

32. යහපත් දේ සිදු කිරීමෙන් නීති රීති සුරැකීමෙන් ලැබෙන ප්‍රයෝජන සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සිතට සතුටක් දැනීම. (2) ප්‍රශංසා හිමි වීම. (3) සමච්චලයට ලක්වීම.


33. මළල ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් ශ්‍රී ලංකාවට කීර්තියක් ගෙන දුන් අයෙක් නොවන්නේ,

(1) සනත් ජයසූරිය (2) ඩන්කන්වයිට් (3) සුසන්තිකා ජයසිංහ

34. ජාතික කොඩියෙහි ජාතික අභිමානය නිරූපනය කරන්නේ,

(1) කහ පැහැති සිංහ රූපයෙනි. (2) රතු පැහැති පසු බිමෙනි. (3) බෝ කොළ හතරෙනි.

35. ලක්වාසින් අතර ජනාදරයට පත් පහත රූපයේ සිටින පුද්ගලයා කවු ද?



(1) මහගම සේකර මහතා

(2) පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා

(3) මාර්ටින් වික්‍රමසිංහ මහතා

36. සිහින් දිගැටි පත්‍ර සහිත ශාකයක් නොවන්නේ,

(1) සේර (2) රම්පේ (3) කොට්ටම්බා

37. ජලය මගින් මෙන් ම සතුන් මගින් ද ව්‍යාප්තවන බීජයකි.

(1) පොල් (2) පුවක් (3) ගම්මාලු

38. රෝපණය කිරීමට නුසුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,

(1) නොමේරූ බීජයක් වීම ය. (2) ගුල්ලන් වැනි සතුන් හානිකර නොතිබීම.

(3) පිටපොත්ත පැල්ලම් රහිත ව දීප්තිමත් වීම ය.

39. ස්වාභාවිකව ම අපට සකසා දෙන රසවත් මෙන් ම ගුණදායක පානයකි.

(1) රණවරා මල් (2) බෙලි මල් (3) තැඹිලි

40. "පිනවන දුටු දන සෑම - ගඟ ළඟ පිහිටි කඳිම "මෙම ගීතයෙන් කියවෙන ඓතිහාසික ශාකය වන්නේ,

(1) ජය ශ්‍රී, මහා බෝධිය (2) කොළඹ මදාරා ගස (3) දෙනිපිටියේ නුගරුක

41. බිත්තියක සිරස් හා තිරස් බව බැලීමට යොදා ගනු ලබන උපකරණ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ලෙවලය හා ලඹ කැටය (2) මුලු මට්ටම ලෙවලය (3) ලඹ කැටය හා ලෙවලය

42. භාණ්ඩ සඳහා ලබාදෙන ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය වන්නේ,

(1) SMS සහතිකය (2) IOS සහතිකය (3) SLS සහතිකය

43. ශරීර වර්ධනය කිරීමට දායකවන ආහාර වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බත්, රොටී, පාන් (2) පරිප්පු, නිවිති, ගොටු කොළ (3) පරිප්පු, මුං ඇට, සෝයා බෝංචි

44. ආහාර ගන්නා අවස්ථාවේ දී පිළිපැදිය යුතු හොඳ පුරුද්දක් වන්නේ,

(1) සබන් යොදා දෑත් සේදීම.

(2) ඉවතලන දෑ පිඟානේ පසෙකින් තබා ගැනීම.

(3) අහාර ගත් ස්ථානය පිරිසිදු කිරීම.


45. අපට දෛනිකව බොහෝවිට වාර්තාවන අනතුරු වන්නේ,

(1) රථවාහන අනතුරු (2) දුම්රිය අනතුරු (3) ගුවන් යානා අනතුරු

46. කෘත්‍රිම වර්ණක හා රසකාරක යොදන ලද ආහාර නිතර භාවිතයෙන් බොහෝ විට ඇති විය හැකි රෝගයකි.

(1) ජලභීතිකාව (2) පිළිකා (3) මහාමාරිය

47. පාපැදියක දැතිරෝද දෙක දම්වැල මගින් සම්බන්ධ කර ඇති ආකාරය පහත රූපයේ දැක්වේ. එය නිරීක්ෂණය කර පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.



(1) විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය ද එක් වටයක් කරකැවේ.

(2) විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය වට කිහිපයක් කරකැවේ.

(3) විශාල දැති රෝදය එක් වටයක් කරකැවෙන විට කුඩා දැති රෝදය වට බාගයක් කරකැවේ.

48. මදුරුවන් මර්දනය කිරීම සඳහා පහසු මෙන් ම වඩාත් සුදුසු ම ක්‍රමය වන්නේ,

(1) නිවසේ හා පාසල් පරිසරයේ සිටින මදුරුවන් විනාශ කිරීම ය.

(2) අවට පරිසරයේ ජලය එක්රැස් වීමට ඉඩ නොතැබීම ය.

(3) මදුරු බිත්තර විනාශ කිරීම ය.

49. සතුන්ගේ පැවැත්මට හානිකර ආකාරයේ මිනිස් ක්‍රියාකාරකමක් නොවන්නේ,

(1) මිනිසාගේ විවිධ අවශ්‍යතා සඳහා කැලෑ එළි කිරීම.

(2) වගාවට කාබනික පොහොර යෙදීම.

(3) මිනිසාගේ විවිධ අවශ්‍යතා සඳහා ගිනි ගොඩවල් ගැසීම.

50. සන්නිවේදනයේ ප්‍රධාන අංග තුනට අයත් නොවන්නේ,

(1) යවන්නා (2) රැගෙන යන්නා (3) මාධ්‍යය

51. යහළුවන්ට සහ නෑදෑයින්ට සුබ පැතුම්පත් යැවීමෙන් බලාපොරොත්තු නොවන දෙයකි.

(1) මානසික සුවයක් ලබා ගැනීමට. (2) අවිශ්වාසයක් ගොඩනගා ගැනීමට.

(3) සුහදතා වර්ධනය කර ගැනීමට.

52. කිසියම් අවස්ථාවක පුද්ගල හැසිරීම්වල දී ගැටුම් ඇති නොවන පරිදි සහනශීලී ව අදහස් ප්‍රකාශ කිරීම තුළින් සිදු නොවන දෙයකි.

(1) ගැටුම් වැළකීම හෝ පාලනය වීම. (2) අන් අයගේ ගරුත්වය ආරක්ෂා වීම

(3) තමාගේ ගෞරවයට හා පෞරුෂයට හානි වීම.

53. අධි රක්ෂිත වනාන්තරයක් සහිත රිටිගල කන්ද පිහිටි දිස්ත්‍රික්කය තෝරන්න.

(1) මාතලේ දිස්ත්‍රික්කය (2) අනුරාධපුර දිස්ත්‍රික්කය (3) පොළෙන්නරු දිස්ත්‍රික්කය

54. අනුරාධපුර රාජධානියේ ඉදි වූවා යැයි සැලකෙන ශ්‍රී ලංකාවේ ප්‍රථම වැව කුමක් ද?

(1) බසවක්කුලම වැව (2) මින්නේරි වැව (3) තිසා වැව

55. යම් පුද්ගලයකුගෙන් හෝ ස්ථානයකින් හෝ සේවාවක් ලබා ගැනීමේ දී,

(1) ආචාරශීලී ව, නීතිගරුක ව හැසිරිය යුතු ය. (2) ආවේගශීලී ව හැසිරිය යුතු ය.

(3) කෙසේ හෝ අන් අයට පෙර තමාගේ කාර්ය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු ය.

56. පදිංචිය සනාථ කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා මුලින් ම යා යුත්තේ,


(1) ප්‍රාදේශීය ලේකම් වෙත (2) ග්‍රාම නිලධාරි වෙත (3) පොලිස් ස්ථානාධිපති වෙත

57. පුස්තකාලය තුළ දී ඔබ නොකළ යුතු දෙයකි,

(1) අන් අයට බාධා නොවන ලෙස පොත් කියවීම.

(2) පොත්වල ඇති වැදගත් කරුණු යහළුවන් සමඟ සාකච්ඡා කිරීම.

(3) පොත්වල ඇති වැදගත් කරුණු වෙනත් පොතක සටහන් කර ගැනීම.

58. 

මෙම රූපයෙන් දක්වා ඇත්තේ,

(1) දණ්ඩ චුම්භකයකි.

(2) විද්‍යුත් චුම්භකයකි.

(3) දඟර චුම්භකයකි.

59. සිතියම්වල ගංගා දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය කුමක් ද?

(1) නිල් වර්ණය (2) දම් වර්ණය (3) කොළ වර්ණය

60. ඔබ ගෙවත්තේ ඇවිදින අතරතුර කුරුලු පැටවෙකු කුඩුවෙන් බිම වැටී කෑ ගසමින් සිටින අයුරු දැක ගැනීමට ලැබෙයි. සතුන්ට ඉතා ආදරය කරන ඔබ මෙවැනි අවස්ථාවක දී කටයුතු කරන ආකාරය ගැන වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. .....

.....

2. .....

.....

3. .....

.....